# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 64 දරන
# ශ්‍රී ලංකා
# ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ
# ආයතනය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 08 වන දින]**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1992 දෙසැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී **ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : ශත 60 යි.** **තැපැල් ගාස්තුව : රු. 1.00 යි.**

# 1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 08 වන දින.]

එල්. ඩී. —ඕ. 13/90

ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයින් විසින් එකඟවී ඇති රීතිවලට අනුකූලව, එකී ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණ හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහාද ඒ පරමාර්ථ සහ කරුණු එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එම ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයින්ද "ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර එකී නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ සහ අලුතු කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

3. පහත දැක්වෙන තැනැත්තන් සංස්ථාවේ සාමාජිකත්වයට සුදුස්සන් වෙති :— සාමාජිකත්වය සඳහා සුදුසුකම්.

(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරි (ක. කා. නි.) සහතිකය දරන යම් තැනැත්තෙක් ;

(ආ) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ වෙනත් යම් විද්‍යාලයක කාර්මික/තාක්ෂණ විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව දරන යම් තැනැත්තෙක් ; සහ

(ඇ) සංස්ථාවේ රීතිවලට අනුකූලව පිළිගනු ලබන වෙනත් යම් සුදුසුකමක් දරන හෝ සංස්ථාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වූ යම් තැනැත්තෙක්.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

4. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) දේශන, සම්මන්ත්‍රණ හා සාකච්ඡා පැවැත්වීමෙන් සහ තාක්ෂණ විද්‍යාශාස්ත්‍රීය ලිපි මගින් හෝ වෙනත් ආකාරයකින් ඉංජිනේරු තාක්ෂණ විද්‍යාවට සම්බන්ධ හෝ ඊට බලපාන විෂයයන්ට අදාළ තොරතුරු ප්‍රචාරය කිරීම ;

(ආ) උසස් අධ්‍යාපනය කෙරෙහි උනන්දු කරවීම සහ ඒ කාර්යය සඳහා, කලින් කල නියම කරනු ලබන රීති හා කොන්දේසි මත වූ තෑග්ගක් හෝ තෑගි හෝ විශිෂ්ටතාවයන් ප්‍රදාන කිරීමෙන් සාමාජිකයන් දිරිගැන්වීම ;

(ඇ) සංස්ථාවේ සාමාජිකත්වයට නැනැත්තන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් නිශ්චය කිරීම පිණිස ඉංජිනේරු විද්‍යාව පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික විභාග පැවැත්වීම ;

(ඈ) සංස්ථාව විසින් නිරණය කරනු ලබන කොන්දේසි සහ ඇප මත සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය කරන ඕනෑම මුදලක් ණයට ගැනීම ;

(ඉ) සංස්ථාවේ කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවන යම් මුදල් සුදුසු යයි හැඟෙන සුරැකුම්පත්වල හෝ දේපළවල ආයෝජනය කිරීම ;

(ඊ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, රික්ථවරණය කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් පුස්තකාලයක් පිහිටුවීම සහ සිතියම්, ආදර්ශක ඇඳීම් සහ අනෙකුත් ද්‍රව්‍යයන්ගේ එකතුවක් ඇති කිරීම හෝ අත්කර ගැනීම සහ ඒවා නඩත්තු කිරීම, ඒවාට යමක් එකතු කිරීම සහ වැඩි දියුණු කිරීම ;

(උ) ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල, සංස්ථාවට සමාන වෘත්තීය ආයතන සහ සංගම් සමග සම්බන්ධතාවන් ඇතිකර ගැනීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීමේ ද, රජයෙන්, වෙනත් ආයතනවලින් හෝ සංවිධානවලින් ප්‍රදානයන් හා වෙනත් ආධාර, ලබාගැනීමේ සහ එකතු කිරීමේ ද අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒවා අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ හිත කර හෝ සියලු කටයුතු, කාරණා හා දේවල් කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, සාමාජිකයන් වර්ග කිරීම සහ රැස්වීම්වලදී ඡන්දය දීමට සාමාජිකයන්ට ඇති අයිතිය සම්බන්ධයෙන් ද කළමනාකරණ සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද, සංස්ථාවේ කටයුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාමාජිකයන්ගේ යම් විශේෂ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේය. එසේ සාදනු ලැබූ යම් රීතියක් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

කළමනාකරණ සභාව.

**7.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත්ව, මෙහි මින් මතු දක්වනු ලබන පරිදි, කළමනාකරණ සභාවක් විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ රීතිවලින් අන්‍යාකාරයකට විධිවිධාන සලස්වනු ලැබුව හොත් මිස, කළමනාකරණ සභාවේ සාමාජිකත්වය සභාපති, හිටපු සභාපතිවරුන් දෙදෙනකු, එක් ජ්‍යෙෂ්ඨ උපසභාපතිවරයකු, උප සභාපතිවරුන් තිදෙනකු, ලේකම්වරයා, එක් උපලේකම්වරයකු, භාණ්ඩාගාරික, සංස්කාරක සහ ඉංජිනේරු තාක්ෂණ ශිල්පයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන සමායතන සාමාජිකයන් විසිඅට දෙනකු යන අයගෙන් සමන්විත විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ ආයතනයේ කළමනාකරණ සභාව සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ සභාව වන්නේ ය.

දේපළ දැරීමට හා හුවමාරු කිරීමට සංස්ථාවට ඇති බලය.

**8.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව—

(අ) මිලට ගැනීමකින්, හුවමාරු කිරීමකින්, ත්‍යාගයක් මගින්, රික්ථවරණය කිරීමකින් හෝ අන්තිම කැමති පත්‍රයකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන කුමන ස්වභාවයක හෝ චංචල හෝ නිශ්චල දේපළක් ප්‍රකාශිත භාරයක් ලෙස හෝ අන්‍යාකාරයකින් සදාකාලිකව හෝ ඊට අඩු යම් කාල සීමාවක් සඳහා දැරීමට හෝ භුක්ති විඳීමට;

(ආ) සංස්ථාවට අයත් ඕනෑම දේපළක් විකිණීමට, ප්‍රදානය කිරීමට, හිමිකර දීමට, පවරා දීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට

නීතියෙහිලා හැකියාව සහ ශක්තතාවය සංස්ථාවට ඇත්තේ ය.

ගාස්තු සහ දායක මුදල් අයකිරීමේ බලය.

9. පහත දැක්වෙන අයකිරීම්, එනම් :—

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් විභාගයකට ඇතුළත් වීම සඳහා යුක්ති සහගත යැයි අදහස් කරන යම් ගාස්තු ;

(ආ) සංස්ථාවේ යම් ශ්‍රේණියක සාමාජිකත්වය සඳහා පුද්ගලයන් තෝරා පත්කර ගැනීම සඳහා වන ගාස්තු ; සහ

(ඇ) සංස්ථාව විසින් සලකනු ලබන සේවාවන් සඳහා යුක්ති සහගත යයි සංස්ථාව සලකන දායක මුදලක් හෝ ගාස්තු

සංස්ථාවේ සාමාජිකයන්ගෙන් අයකර ගැනීමට නීතියෙනිලා හැකියාව සහ ශක්තතාව සංස්ථාවට ඇත්තේ ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.

10. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති ආයතනයේ සියලුම ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් සහභාගි මුදල් හා ගාස්තු මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

11. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ගරු ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, කළමනාකරණ සභාවේ යෝජනා සම්මතයක බලය පිට සහ කළමනාකරණ සභාව විසින් නම් කරනු ලබන නිලධර යන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. තව ද තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්, ඔවුන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

12. සාමාජිකයකුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවලට වඩා වැඩිවන කිසිදු සම්මාදම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් පියවීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් කෙරෙන් හා ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය

පාර්ලිමේන්තු විවාද සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.